# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2399/33 – 2024 අගෝස්තු මස 28 වැනි බදාදා – 2024.08.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2024 අංක 99 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/16/2018/H/26.
ප්‍රා. ලේ.ගේ යොමු අංකය: බිය 3/1/1/501.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමීත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

රනිල් වික්‍රමසිංහ,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2024 අගෝස්තු මස 26 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි. –** ප්‍රාදේශීය ලේකම්, බියගම.

2. **ඉඩමේ විස්තරය.–** බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අධිකාරි පත්තුව සුළු කොට්ඨාසයේ, 280, බියගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බියගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක GA/BIY/2018/150 හා 2018.05.15 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – මිල්ලගහවත්ත – ප්‍රමාණය: හෙක්. 1.8692**

උතුරට: මාර්ගය (මා.සං.අ.); නැගෙනහිරට: එම්. එල්. ඩී. ධර්මසිරි පෙරේරා හිමිකම් කියන මිල්ලගහවත්ත, කේ. ඒ. තාරක සංජීව සහ එම්. එල්. ඩී. ධර්මසිරි පෙරේරා හිමිකම් කියන මිල්ලගහවත්ත; දකුණට: පාර, ඊ. ඒ. ගුණසේන හිමිකම් කියන දෙල්ගහවත්ත සහ කේ. ජී. අනුලාවතී හිමිකම් කියන දෙල්ගහවත්ත; බටහිරට: කැබලි අක්ෂර B.

02. **කැබලි අක්ෂර 'B' – දෙල්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 1.2796**

උතුරට: මාර්ගය (මා.සං.අ.); නැගෙනහිරට: කැබලි අක්ෂර A සහ

කේ. ජී. අනුලාවතී හිමිකම් කියන දෙල්ගහවත්ත; දකුණට: ඒ. පී. ජගත් කුමාර හිමිකම් කියන හේනහත්ත ඉඩම, ප්‍රියදර්ශන සේනාරත්න හිමිකම් කියන හේනහත්ත ඉඩම, කේ. ජී. සිසිර කුමාර හිමිකම් කියන හේනහත්ත ඉඩම සහ පුබුදු ප්‍රසන්න හිමිකම් හේනහත්ත ඉඩම; බටහිරට: ඔවෙල්කා ඉන්ටනැෂනල් සමාගම හිමිකම් කියන හේනහත්ත ඉඩම, පාර, ඇල්බට් පෙරේරා හිමිකම් කියන හේනහත්ත ඉඩම සහ රජිත පෙරේරා හිමිකම් කියන හේනහත්ත ඉඩම.

EOG 08 - 330

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.